# කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය



2025/26 මූල්‍ය වර්ෂය තුළදී, සමාගම සිය ශේෂ පත්‍රයේ ශක්තිමත්භාවය මෙන්ම විනයගරුක රක්ෂණ ප්‍රතිරක්ෂණ ප්‍රමිතීන් ( underwriting standards) පවත්වා ගනිමින් සහ සමස්ත ව්‍යාපාරය පුරා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් ප්‍රබල මූල්‍ය කාර්යසාධනයක් අත්කර ගැනීමට සමත් විය. ඒ අනුව, බදු පෙර ලාභය රුපියල් බිලියන 19.88 ක් වූ අතර, වර්ෂය සඳහා ශුද්ධ ලාභය රුපියල් බිලියන 13.67 ක් දක්වා ළඟා විය.

නිරෝශන් උඩගේ | කළමනාකාර අධ්‍යක්ෂ

## කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය - ඩිජිටල් සංස්කරණය

| Readable Version | | | Audible Version | | |
|---|---|---|---|---|---|
| In English DOC 6 | In Sinhala DOC 7 | In Tamil DOC 8 | English PLAY 5 | Sinhala PLAY 6 | Tamil PLAY 7 |

### ප්‍රවේශ විය හැකි ආකෘතීන්

වඩාත් පහසු සහ ආකර්ෂණීය අත්දැකීමක් සඳහා, භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත PDF සහ ශ්‍රව්‍ය (audio) ආකෘතීන් ඔස්සේ මෙම ප්‍රකාශය පරිශීලනය කරන්න. මෙම සම්පත් සැලසුම් කර ඇත්තේ, සැමට සමාන අවස්ථා සැලසීම (inclusivity) සහ ප්‍රවේශ වීමේ පහසුව තහවුරු කරමින්, පුළුල් පරාසයක පිරිසක් වෙත තොරතුරු ලබා දීම සහතික කිරීම සඳහාය.

# කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය










## කළමනාකාර අධ්‍යක්ෂගේ සමාලෝචනය

### විනයගරුක ක්‍රියාමාර්ග සමගින් අරමුණු පෙරදැරි ගමනක්

2025/26 මූල්‍ය වර්ෂය එල්බී ෆිනෑන්ස් අපට තීරණාත්මක කාලයක් විය. ශක්තිමත් මෙහෙයුම් දියත් කිරීම, වාර්තාගත මූල්‍ය කාර්යසාධනය, වේගවත් කරන ලද ඩිජිටල් ක්‍රියාමාර්ග සහ සියලු ව්‍යාපාරික අංශ තුළ සේවා ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ගත් අඛණ්ඩ උත්සාහයේ ප්‍රගතිය ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාවේ මෙහෙයුම් වාතාවරණය ක්‍රමයෙන් ස්ථාවර වීම සහ ප්‍රධාන ක්ෂේත්‍ර තුළ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීම සමගින් අපගේ අවධානය විනයග රුක වර්ධනය, මෙහෙයුම්වල නොසැලෙන ගුණය, පාරිභෝගික ප්‍රවේශය සහ දිගුකාලීන අගය නිර්මාණය කිරීම කෙරෙහි යොමු විය.

වසර පුරාම අපි, වැඩිදියුණු වූ වෙළෙඳපොළ තත්ත්ව තිරසර ව්‍යාපාරික ප්‍රතිඵල බවට පත්කර ගැනීම වෙනුවෙන් කැප වුනෙමු. කල්පනාකාරීව ණය සේවා පුළුල් කිරීම, භෞතික සහ ඩිජිටල් මාධ්‍ය තුළ පාරිභෝගික සබඳතාව වර්ධනය කිරීම, ආයතනය පුරා ඵලදායීතාව වැඩිදියුණු කිරීම, හවුල්කාරිත්ව ශක්තිමක් කිරීම සහ සියලුමෙහෙයුම් අංශ තුළ දැඩි අවදානම් විනයක් පවත්වා ගැනීම එම ක්‍රියාමාර්ග අතර කැපී පෙනේ.

ගත වූ වසර තුළ අප ළඟාකර ගත් ප්‍රතිඵල මගින්, අපගේ මෙහෙයුම් ක්‍රමයේ ශක්තිය, ආයතනය පුරා තීරණ ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මක බව සහ ශාඛා මෙහෙයුම්, ඩිජිටල් මාධ්‍ය, ප්‍රතිසාධන, අවදානම් කළමනාකරණය, මූල්‍යයනය, තාක්ෂණය සහ සහයෝගී කාර්ය තුළ අපගේ කණ්ඩායම් දක්වන කැපවීම මනාව පිළිබිඹු කෙරේ.

### මෙහෙයුම් විනය මත පදනම් වූ මූල්‍ය කාර්යසාධනය

2025/26 මූල්‍ය වර්ෂය තුළ අප සමාගම, ශේෂ පත්‍රයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, විනයග රුක ප්‍රතිරක්ෂක ප්‍රමිති පවත්වා ගැනීම සහ ව්‍යාපාරික අංශ තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සිදු කරන අතරම ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කිරීමට සමත් විය. ඒ අනුව අපගේ ආදායම් බදු පෙර ලාභය රු. බිලියන 19.88 ක් වූ අතර, ශුද්ධ ලාභය රු. බිලියන 13.67 ක් විය.

ගත වූ මූල්‍ය වර්ෂය තුළ අප සමාගම, ක්‍රමෝපායිකව වැදගත් අංශ තුළ විනයගරුක ලෙස සේවා පුළුල් කිරීම හරහා ණය අංශය ශක්තිමත්කර ගැනීමට සමත් විය. වැඩිදියුණුවන වෙළෙඳපොළ තත්ත්ව සහ සුබදායක පාරිභෝගික ඉල්ලුම මත ණය අංශය ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරමින් ඇ.ඩො. බිලියන 1 ක මට්ටම පසු කිරීමට සමත් විය. එමගින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහ වඩාත් විවිධාංගීකරණය වූ බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලෙස එල්බී ෆිනෑන්ස් හිමිකර ගෙන සිටින ස්ථානය තවදුරටත් තහවුරු විය.

පසුගිය වසරේ රු. බිලියන 173.33 සමස්ත වත්කම් පදනම, මේ වසරේදී රු. බිලියන 395.33 ක් ලෙස වාර්තා වූ අතර එය 64% ක ඉහළ යාමකි.

විනයගරුක ණය අධීක්ෂණය, ශක්තිමත් ප්‍රතිසාධන යාන්ත්‍රණය සහ දූරදර්ශී අවදානම් කළමනාකරණය සමගින් ගෙවුණු වසර තුළ වත්කම්වල ගුණාත්මක බව තවදුරටත් වර්ධනය විය. ඒ හේතුවෙන් ක්ෂේත්‍රයේ අඩුම අක්‍රීය ණය ප්‍රතිශතයවන 1.35% ක් පවත්වා ගැනීමට සමාගමට හැකි විය. තවද, කොටස්හිමියන් හට අඛණ්ඩව ප්‍රතිලාභ හිමිකර දීමට සමත් වූ අප සමාගම, 24.28% ක ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (Return on Equity) සහ 4.30% ක වත්කම් මත ප්‍රතිලාභ (Return on Assets) වාර්තා කළේ, විනයගරුක වර්ධනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ දූරදර්ශී ප්‍රාග්ධන භාවිතය පිළිබිඹු කරමිනි.

පුළුල් කිරීම සහ විනය යනු එකවිට පැවතිය හැකි සාධක දෙකක් බව ගෙවුණු වසර තුළ මනාව පෙන්නුම් කළේය. අප සමාගම ව්‍යාපාර පුළුල් කිරීමටත්, සේවා පෙළෙහි ගුණාත්මකබව ශක්තිමත් කිරීමටත්, ද්‍රවශීලතාව සහ ප්‍රාග ʼධන ශක්තිය ආරක්ෂා කිරීමටත්, දූරදර්ශී ලෙස පරිපාලන ප්‍රමිති පවත්වා ගැනීමටත් කටයුතු කරන අතරම, පාරිභෝගිකයාට ඇති ප්‍රවේශය මෙන්ම ආයතනය පුරා මෙහෙයුම් පරිමාණය කිරීමට ඇති හැකියාව පුළුල් කිරීමට සමත් විය.

# කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

### ඩිජිටල් පරිවර්තනය පුළුල් කිරීම

ගත වූ වසර තුළ ඩිජිටල්කරණය අප සමාගමේ ප්‍රධානතම පරිවර්තන බලවේගයක් බවට පත් විය. ඒ අනුව, වෙනස්වන පාරිභෝගික අපේක්ෂා සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ හැසිරීම් රටාවලට අනුකූලව තාක්ෂණික හැකියාව, ඩිජිටල් යටිතල පහසුකම් සහ මෙහෙයුම් හැඩගැසීම ශක්තිමත් කිරීමට එල්බී ෆිනෑන්ස් සමාගම කටයුතු කළේය.

ඩිජිටල් සබඳතාව ද ගත වූ වසර තුළ වේගවත් විය. ඒ අනුව, CIM App පහසුකම හරහා සිදු කෙරුණු සමස්ත ගනුදෙනුවල වටිනාකම රු. බිලියන 300 ක් ඉක්මවා ගිය අතර, සමාග මේ පාරිභෝගික පදනම තුළ එම යෙදවුමට ඇති වැදගත්කම එමගින් පිළිබිඹු වේ. විවිධ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතරම, පාරිභෝගික ප්‍රවේශය, සේවාවල පහසුව සහ මෙහෙයුම්වල හැඩගැසීම ශක්තිමත් කිරීමට CIM පහසුකම අඛණ්ඩව කටයුතු කළේය.

ගත වූ වසර තුළ අප සමාගම, මෙහෙයුම් කාර්යක්ෂමතාව, තීරණ ගැනීමේ හැකියාව සහ පාරිභෝගිකයාට ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීම ඉලක්කකර ගනිමින් ක්‍රමෝපායික ඩිජිටල් වැඩසටහන් කිහිපයක් වැඩිදියුණු කළේය. Eclipse මොඩලය හරහා ණය පියවීම විධිමත් කිරීම, AI තාක්ෂණයෙන් බලගැන්වූ ණය තක්සේරු සහ ලකුණු ලබා දීමේ ආකෘති ඒකාබද්ධ කිරීම, ක්ලවුඩ් (Cloud) තාක්ෂණය මත පදනම් වූ දත්ත විද්‍යා සහ විශ්ලේෂණ හැකියා පුළුල් කිරීම සහ ඩිජිටල්කරණ ක්‍රියාවලිය වේගවත් කිරීම හා ප්‍රධාන මෙහෙයුම් අංශ ස්වයංක්‍රීයකරණය කිරීම එම ක්‍රියාමාර්ග අතර වේ.

ඒ අතරතුර, ඉතා සංකීර්ණ ඩිජිටල් අවදානම් වාතාවරණයක් මධ්‍යයේ යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව, සයිබර් ආරක්ෂණ පරිපාලනය සහ තොරතුරුවල ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ද විශේෂ අවධානයක් යොමු කෙරිණි. ඒ අනුව ගත වූ වසර තුළ දියුණු සයිබර් ආරක්ෂණ අධීක්ෂණ පද්ධති, උසස් තර්ජන බුද්ධි හැකියා සහ ශක්තිමත් මුදල් හුවමාරු ආරක්ෂාව සාර්ථකව දියත් කෙරිණි. තොරතුරු සහ දත්තවල ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති පවත්වා ගැනීම වෙනුවෙන් එල්බී ෆිනෑන්ස් දක්වන කැපවීම තවදුරටත් තහවුරු කරමින් අපට ISO 27001:2022 තොරතුරු ආරක්ෂණ සහතිකය අඛණ්ඩව හිමිකර ගැනීමට ද හැකි විය.

### ප්‍රවේශය පුළුල් කිරීම සහ ව්‍යවසායකත්වයට මග විවර කිරීම

අපගේ මෙහෙයුම් ක්‍රමය, පාරිභෝගිකයාට සමීපව, වෙළෙඳපොළ අවබෝධයෙන් සහ එකිනෙකට වෙනස් පාරිභෝගික අංශවලට ඔබින මූල්‍ය විසඳුම් පිරිනැමීමේ හැකියාවෙන් යුතුව තවදුරටත් පවත්වා ගැනීමට අපි කටයුතු කළෙමු. ගත වූ මූල්‍ය වර්ෂය තුළ අපි, ලීසිං මූල්‍යයනය, කාරක ප්‍රාග්ධන විසඳුම්, රන් ණය, ලීසිං සහ වෙනත් ආදායම් උත්පාදන මූල්‍ය පහසුකම් සඳහා පුද්ගලයින්, ව්‍යවසායකයින් සහ ව්‍යාපාරවලින් ඇති ඉල්ලුම ඉහළ යමින් පවතින බව හඳුනා ගත්තෙමු.

'එල්බී සන්මිත' සේවාව හඳුන්වා දීම, අප ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සහ නැගීඑන ව්‍යවසායකයින් හට ලබා දෙන සහයෝගය ශක්තිමත් කිරීමේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කළේය. මූල්‍ය විසඳුම් ලබා ගැනීම අභියෝගයක් බවට පත්ව ඇති පාරිභෝගික කාණ්ඩ සඳහා ඒ වෙනුවෙන් ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් යුතුව හඳුන්වා දුන් මෙම සේවාව, ව්‍යවසායකත්වයට මග විවර කිරීම, ජීවනෝපායට සහයෝගය ලබා දීම සහ දිවයින පුරා ආර්ථිකට සම්බන්ධකර ගැනීම පුළුල් කිරීම සඳහා අප දක්වන කැපවීම පිළිබිඹු කරයි.

ශ්‍රී ලාංකේය බැංකු නොවන මූල්‍ය ආයතන අතර විශාලතම ශාඛා ජාලය හේතුවෙන් අප හට දිවයින පුරා ජනතාවට සේවය සැලසීමට වඩාත් පහසු වී තිබේ. අපගේ පුළුල්වන ඩිජිටල් මාධ්‍ය සමග මෙම පුළුල් ශාඛා ජාලය ඒකාබද්ධ කරමින් අපි නගරබද මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පාරිභෝගිකයින්ට ද ප්‍රවේශය, ප්‍රාදේශීය අවබෝධය සහ සබඳතා මත පදනම් වූ සේවා පිරිනමන්නෙමු.

### හවුල්කාරිත්ව සහ පාරිභෝගික පද්ධති

ගත වූ වර්ෂය තුළ අපි, රථවාහන, සෞඛ්‍යය, ගමනාගමන, කෘෂිකාර්මික සහ ජීවනශෛලියට සම්බන්ධ අංශ තුළ ඇතිකර ගත් ක්‍රමෝපායික සබඳතා තුළින් අපගේ පාරිභෝගික පදනම ශක්තිමත්කර ගැනීමට සමත් වීමු. මෙම හවුල්කාරිත්ව හරහා අපට, පාරිභෝගිකයින් සම්බන්ධවන විවිධ ස්ථාන තුළ වඩාත් ඒකාබද්ධ පාරිභෝගික අත්දැකීමක් නිර්මාණයකරන අතරතුර, මූල්‍ය සේවා පාරිභෝගිකයාට වඩාත් සමීප කිරීමට හැකි විය.

Toyota Lanka, DIMO, Browns EV, Hayleys සමූහය සහ E-Channeling ආදී සමාගම් සමග ඇතිකර ගත් සබඳතා, ප්‍රවේශය පුළුල් කිරීම, පාරිභෝගික පහසුව වැඩිදියුණු කිරීම සහ තෝරාගත් අංශ තුළ පාරිභෝගිකයින්ට වඩාත් සම්බන්ධ සේවාවක් පිරිනැමීම සඳහා අපට උපකාරී විය.

පාරිභෝගික හැසිරීම අඛණ්ඩව වෙනස්වන තත්ත්වයක් තුළ මෙම සබඳතා, පුළුල් ජෛව පද්ධති මත පදනම් වූ මෙහෙයුම් ආකෘතියක් තුළ ණය, ගෙවීම් සහ ජීවන ශෛලීය සේවා වඩාත් ඒකාබද්ධ කිරීමට එල්බී ෆිනෑන්ස් අපට අවස්ථා නිර්මාණය කළේය.

### අරමුදල් සම්පාදනය, ද්‍රවශීලතාව සහ මූල්‍ය ධාරිතාව

ස්ථාවර, විවිධාංගීකරණය වූ සහ පිරිවැය-කාර්යක්ෂම අරමුදල් ව්‍යුහයක් පවත්වාගෙන යාම, ගත වූ වසර තුළ තවදුරටත් අපගේ ප්‍රමුඛ අවධානය යොමු වූ අංශයක් විය. දේශීය මෙන්ම ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් එල්බී ෆිනෑන්ස් සම්බන්ධව ගොඩනගා ගෙන ඇති ආත්ම විශ්වාසය පිළිබිඹු කරමින් අපි, වෙනස්වන වෙළෙඳපොළ තත්ත්ව හමුවේ ද්‍රවශීලතාව සහ මූල්‍ය නම්‍යශීලී බව රැකගන්නා අතරම, සාර්ථකව අරමුදල් පදනම ශක්තිමත්කර ගැනීමට සමත් වීමු.

දිවයින පුරා තැන්පත්කරුවන් විසින් අප කෙරෙහි තබා ඇති සවිමත් විශ්වාසය හේතුවෙන්, පාරිභෝගික තැන්පතු තවදුරටත් අප සමාගමේ අරමුදල් අංශයේ ප්‍රධානතම කොටස්කරුවෙකු බවට පත්විය. ඒ අතරම අප සමාගම ගත වූ වසර තුළ ඇ.ඩො. මිලියන 60 ක විදේශීය අරමුදල් හිමිකර ගැනීමට සමත් වූයේ සිය ද්‍රවශීලතා මට්ටම සහ අනාගත වර්ධන අවස්ථා තවදුරටත් පුළුල් කරමිනි.

ද්‍රවශීලතා කළමනාකරණය, අරමුදල් විවිධාංගීකරණය සහ වත්කම් සඳහා ඇති වගකීම උපරිමකරණය වෙනුවෙන් අප ගත් විනයගරුක ප්‍රවේශය හේතුවෙන්, මූල්‍ය ස්ථාවරත්වය සහ ශේෂ පත්‍රය පුරා ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂාකර ගනිමින් ව්‍යාපාරික කටයුතු පුළුල්කර ගැනීමට අපට හැකි විය.

### මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණය

මෙහෙයුම් කාර්යක්ෂමතාව, ගත වූ වසර තුළ ද අපගේ කාර්යසාධනයේ පදනම විය. සමාගම පුරා අපි, ක්‍රියාවලි විනය ශක්තිමත් කිරීමටත්, සේවා පිරිනැමීම වැඩිදියුණු කිරීමටත්, පිරිවැය උපරිමකරණය කිරීමටත්, මෙහෙයුම්වල තීරණය ගැනීම පුළුල් කිරීම සඳහා දත්ත මත පදනම් වූ අවබෝධය යොදා ගැනීමටත් අඛණ්ඩව කටයුතු කළෙමු.

ආන්තික ආරක්ෂාව, ඉහළ ඵලදායීතාව සහ ශක්තිමත් මෙහෙයුම් හැඩගැස්වීම සඳහා මෙම ක්‍රියාමාර්ග දායක විය. ඒ සමගම, විනයගරුක ණය අධීක්ෂණය, පුළුල් ප්‍රතිසාධන යාන්ත්‍රණ සහ දූරදර්ශී

# කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

**'එල් බී සන්මිත' (LB Sanmitha) හඳුන්වා දීම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) සහ නැගී එන ව්‍යවසායකයින් සඳහා අප දක්වන සහයෝගය ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මූල්‍ය පහසුකම් අවම වශයෙන් ලැබෙන (underserved) සමාජ කොටස් වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මූල්‍ය විසඳුම් ලබා දීම සඳහා සැලසුම් කර ඇති මෙම මුලපිරීම මඟින්, ව්‍යවසායකත්වය දිරිමත් කිරීම, ජීවනෝපායන් නැංවීම සහ රට පුරා ආර්ථික සහභාගීත්වය පුළුල් කිරීම වෙනුවෙන් අප සතු කැපවීම මැනවින් පිළිබිඹු වේ.**

සේවා අධීක්ෂණය හේතුවෙන් අපගේ වත්කම්වල ගුණාත්මකබව තවදුරටත් ශක්තිමත් විය.

ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම වේගවත් කිරීමත් සමග, සයිබර් ආරක්ෂාව, දත්ත පරිපාලනය, මෙහෙයුම්වල නොසැලෙන ගුණය සහ නියාමන අනුකූලතාව සඳහා ඇති වැදගත්කම කැපීපෙනෙන ලෙස ඉහළ ගියේය. ඊට ප්‍රතිචාර වශයෙන් අපි, පාරිභෝගික විශ්වාසය, ව්‍යාපාරික අඛණ්ඩතාව සහ පද්ධතිවල සුපිළිපන්න භාවය තහවුරු කිරීම සඳහා තොරතුරු ආරක්ෂාව, මෙහෙයුම් අවදානම් කළමනාකරණය, මුදල් හුවමාරු අධීක්ෂණය සහ පරිපාලන ව්‍යූහ සම්බන්ධ අපගේ පාලනය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කළෙමු.

## මෙහෙයුම්වල තිරසාරත්වය

මෙහෙයුම් කටයුතුවල මුල්‍ය කළමනාකරණය, ණය ක්‍රියාමාර්ග සහ දිගුකාලීන ක්‍රමෝපායික දිශානතිය තීරණය කිරීමේදී තිරසාරත්වය ඊට පදනම්කර ගැනීමට එල්බී ෆිනෑන්ස් අඛණ්ඩව ක්‍රියා කළේය. මෙහෙයුම් කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ණය ක්‍රියාමාර්ග සහ අවදානම් තක්සේරු ක්‍රියාවලි තුළට වඩාත් පුළුල් ලෙස පාරිසරික සහ සමාජයීය වටිනාකම් ඇතුළත් කිරීම සඳහා ගත වූ වසර තුළ අපි අපගේ ESG ප්‍රතිපත්තිය 2.0,ESG මාර්ග සැලැස්ම (ESG Roadmap) සහ පාරිසරික සහ සාමාජයීය කළමනාකරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කළෙමු.

වගකීම්සහගත සහ තිරසර ව්‍යාපාරික ක්‍රියාමාර්ග වෙනුවෙන් අප දක්වන අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් එල්බී ෆිනෑන්ස්, ISO 14001 පාරිසරික කළමනාකරණ සහතිකය හිමිකර ගත් මෙරට පළමු මුල්‍ය සමාගම බවට පත් විය. සිය මෙහෙයුම් කටයුතු තුළ ජාත්‍යන්තරව පිළිගත් පාරිසරික කළමනාකරණ ප්‍රමිති ස්ථාපිත කිරීම තුළ සමාගම පෙන්නුම් කරන නායකත්වය එමගින් වඩාත් තහවුරු වේ.

ගත වූ වසර තුළ අප සමාගම, හරිතාගාර වායු ප්‍රොටෝකෝලය (GHG Protocol), ISO 14064 ප්‍රමිතිය සහ කාබන් මුල්‍ය ගිණුම්කරණය පිළිබඳ හවුල්කාරිත්වය (PCAF) ඇතුළු ජාත්‍යන්තරව පිළිගත් විධික්‍රම යොදා ගනිමින්, ප්‍රධාන විමෝචන, වක්‍ර විමෝචන සහ අනෙකුත් වක්‍ර විමෝචන ආවරණයවන පරිදි දෙවැනි කාබන් පියසටහන් තක්සේරුවට ද සම්පූර්ණ කළේය. මෙම වැඩසටහන් හේතුවෙන් සමාගමේ මෙහෙයුම් සහ මුල්‍යයන විමෝචනවල මිනුම්, කළමනාකරණය සහ විනිවිදභාවය වැඩිදියුණු කරන අතරම දේශගුණික වගවීමේ ව්‍යූහය තවදුරටත් ශක්තිමත් කිරීමට ද අපට හැකි විය.

දේශගුණයට සම්බන්ධ කරුණුවලට ගෝලීයව මෙන්ම දේශීයව ද ඇති වැදගත්කම අඛණ්ඩව ඉහළ යන අතරතුර, එල්බී ෆිනෑන්ස් සමාගම ශ්‍රී ලංකාවේ පුළුල් පාරිසරික ප්‍රමුඛතා සහ ජාතික දේශගුණික කැපවීම්වලට අනුකූලව සිය තිරසාරත්ව න්‍යායපත්‍රය සකස්කර ගැනීමට ඉදිරියටත් කරයුතු කරයි. මෙරට ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්ව (NDCs) සහ කාබන් විමෝචනය අවම සහ වඩාත් තිරසර ආර්ථිකයක් ගොඩනැගීමේ දිගුකාලීන පරිවර්තනයට දායකත්වය ලබාදීම එම ක්‍රියාමාර්ග අතර කැපී පෙනේ.

## මානව සම්පත සහ සේවා සංස්කෘතිය වෙනුවෙන් ආයෝජනය කිරීම

එල්බී ෆිනෑන්ස් සමාගමේ කාර්යසාධනයේත්, නොසැලෙන ගුණයේත් සහ දිගුකාලීන සාර්ථකත්වයේත් පදනම අපගේ මානව සම්පතයි. කාර්යමණ්ඩල සාමාජිකයින් 500 කට අධික සංඛ්‍යාවකගෙන් සැදුම්ලත් ශ්‍රම බලකායක් සමගින්, ගත වූ වසර තුළ ද ශක්‍යතා ශක්තිමත් කිරීම, නායකත්වය ගොඩනැගීම, සේවා ප්‍රමිති ආරක්ෂා කිරීම සහ ආයතනය පුරා වෘත්තීය වර්ධනය සඳහා අවශ්‍ය අර්ථවත් අවස්ථා නිර්මාණය කිරීම කෙරෙහි අපගේ ප්‍රමුඛතාව හිමි විය.

මුල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ කුසලතාපූර්ණ මානව සම්පත වෙනුවෙන් ඇති තරගකාරිත්වය ඉහළ යාමත් සමග අපි බඳවා ගැනීම්, ඉගෙනුම් සහ සංවර්ධනය, කාර්යසාධන කළමනාකරණය, කාර්යමණ්ඩල සබැඳියාව මෙන්ම දිගුකාලීන ලෙස ආයතනික හැකියාව ශක්තිමත් කිරීමට ගොඩනගා ඇති නායකත්ව අනුප්‍රාප්තික වැඩසටහන් සඳහා අඛණ්ඩව ආයෝජනය කළෙමු.

'Super Grade ශාඛා කළමනාකරු' වැනි වැඩසටහන්, ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරන පිරිස් ඇගයුමට ලක් කිරීම, නායකත්ව පෙළ ශක්තිමත් කිරීම සහ අපගේ දිවයින පුරා පිහිටි ශාඛා ජාලය තුළ මෙහෙයුම් විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කළමනාකරණ හැකියාවන් ගොඩනැගීම වෙනුවෙන් අප දක්වන කැපවීම පිළිබිඹු කරයි.

දිවයින පුරා සේවයකරන අපගේ කණ්ඩායම් පෙන්නුම් කරන කැපවීම, අනුවර්තනය සහ නොසැලෙන ගුණය, ගත වූ වසර තුළ සමාගම අත්කර ගත් ජයග්‍රහණවල කේන්ද්‍රය බවට පත්වූ අතර එය, අප සතු වටිනාම ශක්තියක් ලෙස ඉදිරියටත් පවතිනු ඇත.

## විශිෂ්ටත්වය ඇගයීම

වාර්තාකරණය, පරිපාලනය, ඩිජිටල් නවෝත්පාදනය, පාරිභෝගික පහසුව, තිරසාරත්වය, මුල්‍ය අන්තර්කරණය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය යන අංශ තුළ සම්මාන සහ ඇගයුම් රැසකින් පිදුම් ලැබීම හරහා, සමාගම ගත වූ වසරේ වාර්තා කළ කාර්යසාධනය තවදුරටත් තහවුරු විය.

එල්බී ෆිනෑන්ස් සමාගම ගත වූ වසර තුළ TAGS සම්මාන, SAFA සම්මාන, CMA ඒකාබද්ධ වාර්තාකරණ විශිෂ්ටත්ව සම්මාන සහ LankaPay Technovation ඇතුළු සම්මාන සහ ඇගයුම් 20 කට අධික සංඛ්‍යාවකට හිමිකම් කීවේය. අප සමාගමේ පරිපාලන ප්‍රමිති, වාර්තාකරණයේ ගුණාත්මක බව, ඩිජිටල් හැකියාවන්, පාරිභෝගික කේන්ද්‍රීය බව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වෙනුවෙන් දක්වන කැපවීම මෙම ඇගයුම් මගින් යළිත් තහවුරු විය.

සමස්තයක් ලෙස මෙම ජයග්‍රහණ මගින්, එල්බී ෆිනෑන්ස් සමාගමේ මෙහෙයුම් ආකෘතිය සහ ආයතනික සංස්කෘතිය තීරණය කෙරෙන විනය, නවෝත්පාදනය, විනිවිදභාවය සහ සේවා ප්‍රමිතිය පිළිබිඹු කෙරේ.

# කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

> **මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ දක්ෂතාවන් (talent) සඳහා වන තරඟකාරීත්වය දැඩි වීමත් සමඟ, දිගුකාලීනව ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම වෙනුවෙන් සැලසුම් කරන ලද නවක සේවකයින් බඳවා ගැනීම්, ඉගෙනුම් හා සංවර්ධන කටයුතු, කාර්යසාධන කළමනාකරණය, සේවක නියැලුම (employee engagement) සහ නායකත්ව අනුප්‍රාප්තික මුලපිරීම් (leadership succession) සඳහා අපි අඛණ්ඩව ආයෝජනය කළෙමු.**

## ඉදිරිය

අනාගතයේදී අපගේ ක්‍රමෝපායික දිශානතිය නව තාක්ෂණය, නව වෙළෙඳපොළ සහ නව සේවාවලට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත. මෙම ප්‍රමුඛතා විසින් අප ව්‍යාපාරය හැඩගස්වන ආකාරය, පාරිභෝගිකයින් සම්බන්ධකර ගන්නා ආකාරය සහ ශීඝ්‍රයෙන් වෙනස්වන මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ තරගකාරීත්වය ශක්තිමත්කරන ආකාරය පිළිබඳ අපට මගපෙන්වනු ඇත.

ඩිජිටල් හැකියාවන් වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, තෝරාගත් වෙළෙඳපොළ සහ අංශ තුළ ක්‍රමෝපායිකව මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සහ වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සහ හැසිරීමට අනුව වඩාත් ඒකාබද්ධ මූල්‍ය විසඳුම් ගොඩනැගීම සඳහා අපගේ අවධානය යොමුවනු ඇත. UnionPay මාධ්‍යය යටතේ ඩිජිටල් කාඩ්පත සාර්ථකව හඳුන්වාදීමෙන් පසුව අප සමාගම, එළඹෙන මූල්‍ය වර්ෂය තුළ ඩිජිටල් ගෙවීම් හැකියා සහ ජීවන-ශෛලිය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. තවද අපි, LankaQR ගෙවුම් විසඳුම් අඛණ්ඩව පුළුල් කිරීම, ප්‍රවේශය සහ පහසුව වැඩිදියුණු කිරීම සහ දිවයින පුරා වඩාත් පුළුල් ලෙස ඩිජිටල් මූල්‍ය සේවා යොදා ගැනීම හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික ක්‍රමෝපායට සහයෝගය ලබාදීමට ද අඛණ්ඩව කැප වන්නෙමු.

ආර්ථිකය තුළ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම වෙනුවෙන් අප සතු දිගුකාලීන සැලැස්මේ එක් පියවරක් ලෙස අප සමාගම පිලිපීනයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා ක්‍රමෝපායික ආයෝජනයක් සිදුකළ අතර, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සහ රථවාහන මූල්‍යයන විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් එහි මෙහෙයුම් කටයුතු එළඹෙන මූල්‍ය වර්ෂය තුළ ආරම්භ කිරීමට අපේක්ෂිතය.

සවිමත් ශේෂ පත්‍රයක්, විශ්වසනීය සන්නාමයක්, පුළුල්වන පාරිභෝගික පද්ධතියක් සහ කැපවුණු ශ්‍රම බලකායක් සමගින් එල්බී ෆිනෑන්ස් සමාගම, සිය ව්‍යාපාරික ආකෘතිය, ක්‍රමෝපායික දිශානතිය සහ අරමුණු පෙරදැරිව හැඩගැස්වෙන අතරම අඛණ්ඩව තීරණ දියත් කිරීමට ඇති හැකියාව තුළින් ආත්ම විශ්වාසයෙන් යුතුව අනාගතයට පා තබයි.

## ස්තූතිය

නොවෙනස් විශ්වාසයකින් සහ ලෙන්ගතුබවකින් අප සමග රැඳී සිටින පාරිභෝගිකයින්ටත්, වසර පුරාම අපට මගපෙන්වූ අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සහ නියාමකවරුන්ටත් මාගේ හෘදයංගම ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.

කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ කාලය තුළ දැක්වූ දායකත්වය හා නායකත්වය වෙනුවෙන් සුමිත් ආදිහෙට්ටි මහතාට අපගේ ස්තූතිය හිමිවිය යුතුය.

තවද, කැපවීමෙන්, උනන්දුවෙන්, නොසැලී කටයුතු කරන එල්බී ෆිනෑන්ස් කණ්ඩායමට ද මාගේ කෘතවේදීත්වය පිරිනමමි. ගත වූ වසරේ ළඟාකර ගත් කාර්යසාධනය යනු ඔවුන්ගේ සාමූහික උත්සාහයේත්, මෙහෙයුම් විනයේත්, දිවයින පුරා සිටින අපගේ පාරිභෝගිකයින් හට සේවය කිරීමට දැක්වූ නොසැලෙන අවධානයේත් පිළිබිඹුවකි.

ජවසම්පන්න, වගකීම්සහගත, අනාගතයට සූදානම් සහ ඉදිරියේ ඇති අවස්ථාවලින් ඵල නෙළා ගැනීමට මනාව සූදානම් සමාගමක් ගොඩනැගීම සඳහා යන ගමනේදී නිරන්තරයෙන් මගපෙන්වන, සහයෝගය සහ ආත්ම විශ්වාසය ලබා දෙන සභාපතිතුමාටත්, අධ්‍යක්ෂ මණ්ඩලයටත් මාගේ නොමඳ කෘතඥතාව පිරිනමමි.



නිරෝෂන් උඩගේ
කළමනාකාර අධ්‍යක්ෂ

29 මැයි 2026